# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 295 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 19/02/2024 පැය 0810

## මාධ්‍ය නිවේදනය

**01. මනුෂ්‍ය ඝාතනයක් - වැලිමඩ පොලිස් වසම.**

2024.02.18 වන දින රාත්‍රී කාලයේ වැලිමඩ පොලිස් වසමේ ඩයරබාවත්ත, උඩකොටස ප්‍රදේශයේ නිවසක කාන්තාවක් මියගොස් ඇති බවට වැලිමඩ පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 36 ක් වූ ඩයරබාවත්ත, උඩ කොටස ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මරණකාරියගේ ස්වාමිපුරුෂයා විසින් මෙම ඝාතනය සිදුකර ඇති බවත්, දෙදෙනා අතර ඇතිවූ බහින් බස් වීමක් හේතුවෙන් අතින් පයින් හා පිහියකින් පහරදී මෙම ඝාතනය සිදුකර ඇති බව සිදුකල විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය සිද්ධිය වූ ස්ථානයේ පොලිස් ආරක්ෂාව යටතේ ඇත. පශ්චාත් මරණ පරීක්ෂණ කටයුතු වැලිමඩ රෝහලේ දී සිදුකිරීමට නියමිතය. ඝාතනය සිදුකල වයස අවුරුදු 35 ක් වන සැකකරු අත්අඩංගුවට ගෙන ඇති අතර වැලිමඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. යාපනය ප්‍රදේශයේ පාසල් ළමුන් ඉලක්ක කර අළෙවි කිරීම සඳහා ගංජා මිශ්‍ර මාවා සන්තකයේ තබාගෙන සිටි පුද්ගලයකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකාය යාපනය කඳවුර.**

2024.02.18 වන දින යාපනය පොලිස් වසමේ කාරෙයිකාට්ටු පාර, වන්නාර්පන්නෙයි ප්‍රදේශයේ පිහිටි නිවස ඉදිරිපිට දී පොලිස් විශේෂ කාර්ය බලකාය යාපනය කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරකට අනුව වැටලීමක් සිදුකර ගංජා මිශ්‍ර මාවා කිලෝ ග්‍රෑම් 05 ක් සන්තකයේ තබාගෙන සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වැඩිදුර විමර්ශන කටයුතු සඳහා යාපනය පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් වන කොකුවිල් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු විසින් මෙම මත්ද්‍රව්‍ය පාසල් ළමුන් ඉලක්ක කර ගනිමින් දීර්ඝ කාලයක සිට අළෙවි කර ඇති බවට අනාවරණය වී ඇත. යාපනය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**